2022

වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම්
வருடாந்த செயலாற்று அறிக்கை மற்றும்
கணக்கறிக்கை
Annual Performance Reports & Accounts



අම්පාර,වඩිනාගල ජයන්ති වැව



Designed : IT Unit ,Distsec Ampara | Photographed : District Media Unit

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර්.
மாவட்ட செயலகம் - அம்பாறை.
District Secretariat - Ampara .

දිසාපතිතුමාගේ පණිවුඩය



2022 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලැබූ සේවාවන් හා සිදු කරනු ලද ව්‍යාපෘතීන් කේන්ද්‍ර කොට ගනිමින්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටින් සහ තෘප්තියෙනි. 2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී මූල්‍ය පාලනය පාදක කර ගනිමින් මෙම වාර්තාව පිළියෙල කර ඇත.

ගල්ඔය ගංගා නිම්නයේ ජනපදකරණයට යටත් වූ පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ජාතික නිෂ්පාදනයේ විශාල පංගුවකට හිමිකම් කියන අම්පාර දිස්ත්‍රික්කය සාර්ථක කරදිය සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තයෙන් ද රටෙහි පෝෂණ අවශ්‍යතා සපුරා ලීමට දායක වේ. විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතනයක්, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික පාසල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසැල් ඇතුළු දියුණු කාර්මික පුහුණු ආයතන හා පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ශනීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මඟුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය, කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයක් බවට පත්වී ඇත.

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරු පිරි දිස්ත්‍රික්කයක් ලෙස ගොඩනැඟෙමින් පවතින අම්පාර දිස්ත්‍රික්කයට අනිගරු ජනාධිපතිතුමන්ගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන්, විශේෂයෙන්ම හරිත කෘෂි කර්මාන්තයෙන් පරිපූර්ණ වූ නිරසර ගොවිතැනින් සුරක්ෂිත ආහාර දැයට දායාද කිරීම අරමුණු කොට ගත් මේ ව්‍යාපෘතිය දිස්ත්‍රික්කයේ හෙට දවස වෙනුවෙන් සිදුවන මහඟු ආයෝජනයක් වනු ඇත.

කෘෂි ආර්ථිකය ජීවනාලිය කරගත් දිගාමඩුලු ගොවි ජනතාව ආර්ථික වශයෙන් සවි බල ගන්වමින්, පවත්නා ගොවිපල පද්ධතිය නිරසර, හරිත ගොවි පද්ධතියක් බවට කළමනාකරණය කරමින්, යෝග්‍ය තාක්ෂණය උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිත කර ප්‍රශස්ත ඵලදායීතාවයක් ලබා ගනිමින් දිගාමඩුලු ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ජාතික ආර්ථිකයේ ප්‍රමුඛතම ආහාර නිෂ්පාදකයා වෙමින්, විදේශීය වෙළඳපොල කෘෂි නිෂ්පාදන ඔස්සේ ජය ගනිමින්, ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම අපගේ මුඛ්‍ය පරමාර්ථය යි. එකී සුවහසක් ජනයාගේ ජීවිත විකසිත කරමින් ඉසුරු පිරි හෙට දිනයක් උදා කරනු වස් අදාළ චක්‍රෝල්ඛ, අණ පනත්, නීති රීති, රෙගුලාසි වලට අනුගත වෙමින්, එහෙත් හැකි උපරිමයෙන් ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා හැකි උපරිම ධාරිතාවය යොදවමින්, පළාතේ දේශපාලන අධිකාරියේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ රාජ්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමේ අති භාර දූර වගකීම අපගේ උර මත පැටවී ඇත. මෙකී වගකීම ඉටු කිරීමේදී, මෙම කාර්ය සාධන වාර්තාවේ සඳහන් අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අනුශාෂ්‍යකත්වය ලබාදුන් සර්ව ආගමික නායකත්වය ද සහයෝගය ලබාදුන් දේශපාලන අධිකාරිය ද එයට අමතරව මෙම කර්තව්‍යයන් උදෙසා සෘජු හෝ වක්‍රව අප හා සම්බන්ධ වූ අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩල සිවිල් සමාජ සංවිධාන, ග්‍රාමීය කමිටු යනාදීය ද ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

මෙකී කාර්ය භාරය තුල, ඉහල කාර්ය සාධනයකින් යුතුව මෙම වාර්තාවේ සඳහන් ඉලක්ක කරා ළඟා වීම සඳහා ඉතා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළ පිරිස වූයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල පද්ධතිය අතර සමායෝජනය හා කළමනාකරණය කරමින්, පසුගිය වසරේ දී අපගේ ඉලක්ක සපුරා ගැනීමට උපරිම දායකත්වය සැපයූ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යක්ෂ (සැළසුම්) හා අනෙකුත් අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ඉංජිනේරු සහ සියලුම කාර්ය මණ්ඩලයටත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රධාන එම කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ ප්‍රශංසාව පිරිනමමි.

එසේම, පවතින ආර්ථික අර්බුදයත් සමඟ ඉන්ධන නොමැතිවීමේ අර්බුදයට මුහුණු දුන් අවස්ථාවේ, වී ගොවිතැනෙන් ප්‍රමුඛත්වයේ සිටින දිස්ත්‍රික්කයක් වශයෙන්, අදාළ ආයතන සමඟ සාකච්ඡාකර, ප්‍රායෝගික ක්‍රමෝපායන් සකස් කර අපේක්ෂිත අස්වැන්නම ලබා ගැනීමට හැකියාවක් ලැබුණු අතර කර්මාන්ත, ස්වයංරැකියා, වෙළඳාම, සෞඛ්‍ය, ප්‍රවාහනය වැනි එදිනෙදා ජන ජීවිතය අඩාල නොවන පරිදි දිස්ත්‍රික්කය සාමකාමීව පවත්වාගෙන යාමට හැකිවූ බව සතුටින් සිහිපත් කරන අතර, ඒ සඳහා සෘජු සහ වක්‍ර අයුරින් දායක වූ සියලු නිලධාරීන් ඇතුළු මහජනතාවට මාගේ ප්‍රශංසාව පළ කරමි.

ජේ.එම්.ඒ.ඩබ්ලස්,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

Contents

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 4

1.3 ප්‍රධාන කාර්යයන් 5

1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර 6

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන 7

1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන 8

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 8

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 9

03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 13

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 13

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 15

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 16

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 27

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 28

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 29

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 32

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 33

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 54

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 54

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම. 55

5.1 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය 55

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න. 57

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 58

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 58

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම 58

06.3 මානව සම්පත් සංවර්ධනය 59

07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 60

01. **පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම

<u>විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය</u>

පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. මෙහි භූමිය තැනින් තැන පිහිටි ශේෂ කඳුවලින් යුක්ත තැනිතලාවකි. මේ තැනිතලාව මුහුදු මට්ටමේ සිට සාමාන්‍යයෙන් අඩි 200 දක්වා ද හෙල් මුදුන්වල අඩි දහස දක්වා ද උස්ව පිහිටියේය. මේ සැබවින්ම සියල් සිරින් පිරි බිම් කඩෙකි. ඈත උෆවේ කඳුකරය පශ්චාත් භාග කොට ගත් අඳුරු වන තීරයෙන් ආරම්භ වී මෑත වෙරළ තීරය තෙක්ම එක එල්ලේ විහිදී ගිය මනහර වෙල්යායෙකි. එය පෙර රජ දවස දකුණු දිග වෙරළ තීරය දක්වාම පැතිර පැවතියෙකි. මේ පෙදෙසේ සිත්කළු දර්ශනය සෘතුවෙන් සෘතුව වෙනස් වෙස් ගෙන බැබළෙනි. වැසි කලට නිබඳ දියෙන් පිරීගත් කලපුවක සිරි ගන්නේය. ඊසාන මෝසම දුර්වන වෙද්දී පළාවන් ගොයමින් වැසි හරිත සමුද්‍රයක ශෝභාව පාන්නේය. ගොයම වැඩෙද්දී සිංහල ,දෙමළ හා මුස්ලිම් ගොවි දනන්ගේ පැල් වෙල් යායේ තැනින් තැන පැන නැඟ එයි. කුඹුර පැසෙද්දී ඈත වන තීරයෙන් එළි බැස එන අලින්, උෆරන්, මොණරුන් වැනි වන සතුන් මතු වෙයි. නැවත අස්වනු අස් කොට ගත් පසු මේ භූමිය එළ, මී, ගවයින් සිය ගණනින් සැදී රංචු සැරිසරන සුන්දර දර්ශනයක් මවයි. වියළි අගෝස්තුව වන විට දීප්ත සූර්ය රශ්මියෙන් පොළව දා ගිය කල සතෙකුට තණපතක් දිය බිදක් නැති කර්කශ, වේගවත් මාරුතයෙන් උඩ නැගී කැරකෙන දූවිල්ලෙන් වැසුණු බිමක් බවට පෙරළේ.

මඩකලපුව දිසාපතිවරයා යටතේ රටේ මහත්තුරුන් විසින් පරිපාලන රාජකාරී සිදු කරන ලද මෙම බිම් කඩෙහි 1924 දී වැව්ගම්පත්තුව නමින් නව පරිපාලන ඒකකයක් ස්ථාපිත විය. වැත්තෑවේ රටේ මහත්තයා එහි පළමු රටේ මහත්තයා වූ අතර, පැරණි වාරිමාර්ග නැවත පිළිසකර කිරීමේ කටයුතු වේගවත්ව එම කාලය තුළ දී සිදුව ඇත. එලෙස ඇරඹි සංවර්ධනයේ කූඨප්‍රාප්තිය සනිටුහන් කරමින් ඩී.එස්.සේනානායක ශ්‍රීමතාණන්ගේ මෙහයවීමෙන් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය දියත් විය. එම ගොවි ජනපද ව්‍යාපාරයේ අනගිතම නිමවුම අම්පාර දිස්ත්‍රික්කයයි. වැව්ගම්පත්තුව, බින්තැන්නපත්තුව, පානම්පත්තුව, සම්මන්තුරේපත්තුව, නින්දවූර්පත්තුව, අක්කරපත්තුව ඇතුළු පැරණි පරිපාලන ඒකක එකතු කර 1961 වර්ෂයේදී අම්පාර නමින් වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ස්ථාපිත විය. 1961 අප්‍රේල් 10 දින ජේ.ඩී.එස්.ඩී ලියනගේ මහතා මෙහි පළමු දිසාපතිවරයා ලෙස පරිපාලන රාජකාරී ඇරඹීය. 80 දශකයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මහවැලි සී කලාපය හෙවත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශය ද මෙම දිස්ත්‍රික්කයට එක් විය. වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය සම්මන්තුර ,කල්මුණ, පොතුවිල්, අම්පාර යන ඡන්ද ප්‍රදේශ 04 ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක්, ග්‍රාම නිලධාරී වසම් 503 ක් හා ගම්මාන 614 කින් සමන්විතය. ඒ අතර, මහනගර සභා 02 ක් නගර සභා 01 ක් ප්‍රාදේශීය සභා 17 ක් හා පොලිස් ස්ථාන 14 ක් පවතී. කිලෝමීටර් 115 ක් පුරා දිවෙන දර්ශනීය වෙරළ තීරය ද, තැනින් තැන පිහිටි ශේෂ කඳු ද, ගමින් ගම පිහිටි නිල්දිය පිරි මහ වැව් ද, ඒ වැව් ඔස්සේ පීදෙන හරිත වෙල් යාය ද, වන සතුන් නිදහසේ සරනා වන ගොමු ද, මෙම දිස්ත්‍රික්කයේ සුන්දරත්වය සේම වටිනාකම ද ඉහළ නංවයි. දිස්ත්‍රික්කයේ බහු ආගමික, බහු සංස්කෘතික උරුමයන් විදහා දක්වමින් විහාරස්ථාන 223 ක් ද, හින්දු කෝවිල් 203 ක් ද, මුස්ලිම් පල්ලි 369 ක් හා ක්‍රිස්තියානි පල්ලි 74 ක් ද පවතී.

ජන සංඛ්‍යා ලේඛණ දත්තවලට අනුව (දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ 2019) අම්පාර දිස්ත්‍රික්කයේ ජනගහනය සමස්ථ ජනගහනය 728,086 කි. පවුල් සංඛ්‍යාව 205,211 ක් වේ. මෙම සමස්ථ ජනගහනය තුළ 41.49% ක් මුස්ලිම් ජනතාව ද, 35.32% ක් සිංහල ජනතාව ද 22.581% ක් දෙමළ ජනතාවගෙන් හා 0.6% ක් අනෙකුත් ජනතාව ද නියෝජනය වන අතර, මෙම සියලු ජාතීන් සමඟියෙන් හා සහජීවනයෙන් ජීවත් වෙති.

මෙම දිස්ත්‍රික්යේ වපසරිය වර්ග කිලෝමීටර් 4,415 ක් වේ.. මෙහි සමස්ථ වගා බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1,264.47 කි. අභ්‍යන්තර ජලාශ ලෙස වර්ග කිලෝමීටර් 328.03 ද වනාන්තර ප්‍රමාණය (Forest & Range Land) වර්ග කිලෝමීටර් 2,097.53 ක් ද වේ. මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1,886 ක් පමණ වන අතර, සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29.81 ක මට්ටමේ පවතී.

දිවයිනේ විශාලතම ජලාශය වන සේනානායක සමුද්‍රය ආශ්‍රිත වාරි පද්ධතිය මඟින් පෝෂණය වෙමින් ශ්‍රී ලංකාවේ ජාතික වී නිෂ්පාදනයෙන් 22.5% ක් දැයට උරුම කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ '' ජාතියේ වී බිස්ස" යන විරුදාවලිය ලත් අම්පාර දිස්ත්‍රික්කය උක් වගාව, අතිරේක බෝග වගාව, පශු සම්පත් සහ

සාර්ථක කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ජාතික ආහාර නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය හිමි කරගෙන ඇත.

විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතන, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසල් ඇතුළු දියුණු පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත. ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ඵලදායිතා සම්මානයන්ගෙන් පිදුම් ලත් සෞඛ්‍ය සේවයක් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වීම ගොවි ජනයා ප්‍රමුඛ ප්‍රදේශවාසීන්ට මහත් අස්වැසිල්ලක් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ෂණීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, කුමන ජාතික කුරුලු උයන, ලාහුගල ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මගුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය , කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරයන්ගේ පාරාදීසයක් බවට පත්ව ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු,මායා,පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි. රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපි හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය.මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඬුවස් දෙවි රජුගේ අවධියේය. පඬුවස් දෙවි රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපි,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණීගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය.මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ඨාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ.පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතුවලදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් නිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක.

ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යයන් විසින් පිහිටවුනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කථාකරන කළ රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබී ඇති ප්‍රදේශයකි. මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක "යෙ ඉමදිය පටමය අගනන ඉධීක තෙර මහිද තෙර තුබෙ "යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්වීපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨීය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිදු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨීය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිදු හිමි පිරිනිවන් පෑ පසු දාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි.මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක් සේ හඳුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි. එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ

බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදි දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රගේ පුතෙක් සමග විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ.

දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන් සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගනිති. එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව " අලෙවිය සඳහා පිටතින් බඩු නොගෙන්විය යුතු බවට" කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොලී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඇත.එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ.සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාමඩුල්ල අවනතව තිබූ බවට තොරතුරු ලැබිණි.මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතුන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමග යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නීග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මැනක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේ ලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනීම වාරිකර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවීම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදි පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂී සිදුවීමක් විය. පට්ටිපොල ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෘක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පළාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රීකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශ වලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්ක වලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රීකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම් වලට පාත්‍ර නොවුණි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

<u>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර</u>
<u>ප්‍රකාශය හා අගයන්</u>

දැක්ම

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක්.

මෙහෙවර

දිස්ත්‍රික්කයේ සම්පත් ප්‍රශස්ත ලෙස යහපාලනමය යාන්ත්‍රණය ඔස්සේ කළමනාකරණය කර නිරසර සංවර්ධනය කරා මෙහෙයවමින් නිදහස් හා සුරක්ෂිත හෘදයාංගම පරිසරයක දැනුමෙන්, නිපුණත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හා නිරෝගී බවින් සපිරුණු ඉහළ ජීවන තත්ත්වයෙන් හෙබි, ජනතාවක් සහිත ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් හොඩ නැඟීම.

අපේ අගයන්

- හෘදය සංවේදී රාජ්‍ය සේවක කැළක්.
- සොයා එන හැම දන මන විකසිත වන විශ්වසනීය සේවයක්.
- නව්‍යත්වය සොයමින් සැනෙකින් විසඳුම් සොයා යන කාර්යය සංස්කෘතියක්.
- පිවිතුරු හා හරිත පරිසරයක් තුළින් අවියෝජනීයව අවශ්‍යතාවයන් ඉටු කර ගන්නා වූ ප්‍රසන්න පරිශ්‍රයක්.
- යහපානලමය යොමුවක්

1.3 ප්‍රධාන කාර්යයන්

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.</u>

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ආයතන කාර්යය (ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයුතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිලධාරීන්ගේ පරිපාලන කටයුතු
- වී මිල දී ගැනීම් කටයුතු

<u>දිස්ත්‍රික් ලෙක්ම් කාර්යාලයේ ගිණුම් අංශයේ කාර්යය භාරය</u>

- දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ප්‍රතිපාදන හා අක්මුදල් බෙදා හැරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ ගිණුම් වාර්තා සකස් කිරීම හා ගණන්දීමේ නිලධාරී වෙත වාර්තා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම ගෙවීම් කටයුතු

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය හා සම්බන්ධීකරණ අංශවල කාර්යය භාරය</u>

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- සමාජසේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා කුසලතා වර්ධන පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හා හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජූරි සභික නාමලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හරහා සහයෝගය ලබාදීම.
- ආපදා කළමනාකරණ හා සුනාමි නැවත ගොඩනැංවීමේ කටයුතු
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර



1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කලුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෙෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැඳී පවතී. බොහෝ දෙනෙකු මෙය හඳුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශවලින් සමන්විතය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඇති දුර
1	දෙහිඅත්තකණ්ඩිය	13	121
2	පදියතලාව	20	82
3	මහඔය	17	62
4	උහන	55	11
5	අම්පාර	22	-
6	දමන	33	17
7	ලාහුගල	12	80
8	පොතුවිල්	27	75
9	තිරුක්කෝවිල්	22	42
10	ආලයඩිවෙම්බු	22	28
11	අක්කරපත්තුව	28	28
12	අඩ්ඩාලච්චේන	32	29
13	ඉරක්කාමම්	12	10
14	නින්දවුර්	25	26
15	කාර්නිවි	17	24
16	සායින්දමරුදු	17	25
17	කල්මුණ	29	28
18	කල්මුණ උතුර (උපකාර්යාලය)	29	28
19	නාවිදන්වේලි	20	24
20	සම්මන්තුර	51	20

1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

අනු අංකය	දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ
1.	දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
2.	සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
3.	දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය
4.	සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
5.	දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලය
6.	මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
7.	දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය.
8.	ආපදා කළමනාකරණ අංශය
9.	දිස්ත්‍රික් ක්‍රීඩා අංශය
10.	නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
11.	සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය(පළාත්)
12.	දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය
13.	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
14.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය.
15.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය
16.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (නිබේ නම්)

හිස් වාර්තාවකි.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2022 වර්ෂය සඳහා ඉලක්ක සපුරා ගැනීම, ඒ සඳහා ඇති වූ අභියෝග හා 2023 වර්ෂයේ අපේක්ෂාවන්

01. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ක්‍රියාකාරකම්

2022 වර්ෂයේ ක්‍රියාත්මක වූ "ගම සමඟ පිළිසඳර වැඩසටහන ප්‍රධානතම සංවර්ධන ව්‍යාපෘතිය විය. මෙම ජාතික මට්ටමේ වැඩසටහන ප්‍රධාන උප වැඩසටහන් 4ක් යටතේ ක්‍රියාත්මක විය. එනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්, පළාත් පාලන ආයතන මට්ටමින් සංවර්ධන වැඩසටහන්, ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන හා විමධ්‍යගත අයවැය වැඩසටහනයි.

මෙම වැඩසටහන යටතේ අවශ්‍ය කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා සමාජ සුභසාධන සංවර්ධනය මෙන්ම පාරිසරික සංරක්ෂණය කිරීම තුළින් පුද්ගලයින්ගේ ජීවනෝපාය සංවර්ධනයට සහාය වීම අපේක්ෂාව විය. මෙම වැඩසටහන දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන ලෙස ක්‍රියාත්මක විය.

කොවිඩ්-19, ඉන්ධන හා ගෑස් හිඟය හා උද්ධමනය හා ආශ්‍රිත ආර්ථික අවපාතය හවුවේ ඇති වූ මහජන නොසන්සුන්තාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. කෙසේ වෙතත් වසරේ පළමු කාර්තුව තුළ අනුමත ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි විය. නමුත් මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කළ 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 යටතේ ඉතුරු කාර්තු තුනෙහි කාර්යයන් අත්හිටුවීමට සිදුවිය.

ඒ අනුව 2022 වර්ෂයේ ඇති වූ අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුවද "ගම සමඟ පිළිසඳර" වැඩසටහන යටතේ රුපියල් මිලියන 459.84 ක වටිනාකමින් යුතු සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකිවිය.

එමෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ම ආවරණය වන ලෙස ක්‍රියාත්මක වූ එළුවන් පාලන ව්‍යාපෘතිය මඟින් සත්ත්ව පාලන ක්ෂේත්‍රය තුළින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහත නැංවීම අරමුණ වූ අතර මෙම වැඩසටහන මඟින් පවුල් 154 ක් සඳහා රුපියල් මිලියන 7.01 ක් වටිනා එළුවන් 308 ක් බෙදා දීම සිදුවිය.

සංවර්ධන කටයුතුවල ප්‍රගතිය - 2022 (2022.12.31 දිනට)

අනු අංකය	ව්‍යාපෘති යෝජනාව	2022 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන රුපියල් මිලියන	නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වියදම
1.	ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා රුමිලියන 03 ක් වටිනා ව්‍යාපෘති)	300	688	211.49
2.	පළාත් පාලන කොට්ඨාස සංවර්ධන ව්‍යාපෘති (එක් පළාත් පාලන කොට්ඨාසයක් සඳහා රුමිලියන)	179	379	116.28
3.	ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (එක් පාර්ලිමේන්තුව මන්ත්‍රීවරයෙකු සඳහා රුමිලියන 100 ක් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු උප සභාපතිවරයෙක් සඳහා රුමිලියන 20)	150	306	117.50
4.	විමධ්‍යගත අයවැය	15.47	110	14.57
5.	එළුපාලන ව්‍යාපෘතිය	7.08	1	7.01
එකතුව		651.55	1484	466.85

මෙයට අමතරව අලි මිනිස් ගැටුම හා ගොවියන්ගේ අස්වනු හා ජීවිත හානි තුරන් කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක විය

02. කෘෂි අංශයේ කාර්ය සාධනය හා පෝෂණය හා ආහාර සුරක්ෂිතතාව

රටේ ඇති වූ අහිතකර ආර්ථික තත්ත්වය හමුවේ ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දුන් අතර රැකියා අහිමි වීම, භාණ්ඩ මිල ඉහළ යාම හමුවේ මිලදී ගැනීමේ හැකියාව පහළ යාම, සෞඛ්‍යාරක්ෂිත ආහාර සපයා ගැනීමේ හා පරිභෝජනය කිරීමේ හැකියාව අඩු විය. මෙම තත්ත්වය හමුවේ ග්‍රාමීය පවුල් ශක්තිමත් කිරීම හා සාගින්නට ලක්වීම මඟහැරවීම සඳහා "බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් තුළින් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන මධ්‍යස්ථාන බල ගැන්වීමට රජය විශේෂ වැඩසටහනක් හඳුන්වා දෙන ලදී.

මේ යටතේ දිස්ත්‍රික්කයේ සියළුම ගම්මාන ආවරණය වන පරිදි ග්‍රාමීය පුනර්ජීවන කමිටු 503 ක් පිහිටුවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි වූ අතර එමඟින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහයෝගීත්වයෙන් ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට හැකි විය.

2022 යල කන්නය සඳහා ප්‍රධාන භෝග වැඩි වශයෙන් වගා කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ගොවීන් දිරිගැන්වූ අතර මෙමඟින් ස්වයංපෝෂී තත්ත්වය ළඟා කර ගැනීම අපේක්ෂාව විය. පහත වගුව මඟින් ප්‍රධාන භෝගයක් වගා කළ භූමි ප්‍රමාණය හා නිෂ්පාදනය පිළිබඳව සාරාංශයක් දැක්වේ.

භෝගය	වගා කළ භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	අස්වැන්න (මෙට්‍රික් ටොන්)
වී	61,438	239,608
බඩඉරිඟු	316.56	670.82
මිරිස්	114.39	444.53
රටකජු	136.46	145.12
කවුපි	2,905.50	2,378.17
මුං ඇට	519.58	450.87
උඳු	42.23	35.59
මෙනේරි	24.45	17.65
තල	23.30	16.30

(මූලාශ්‍රය :- දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර)

කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීමේ අරමුණෙන් භෝග වගා වැඩසටහනක් සම්පූර්ණ දිස්ත්‍රික්කයම ආවරණය වන ලෙස ක්‍රියාත්මක වූ අතර ඒ යටතේ මු ඇට හා උඳු වගාව සඳහා ගොවීන් වෙත පහසුකම් සපයන ලදී. මෙම වගා ව්‍යාපෘතියේ සමස්ථ වියදම රුපියල් මිලියන 6.2 ක් විය. ඊට අමතරව හෙක්ටයාර් 81168 ක වී වගාවද, හෙක්ටයාර් 13051 ක බඩඉරිඟු වගාවද හෙක්ටයාර් 161 ක කුරක්කන් වගාවද 2022/23 මහකන්නයේ දී වගා කරන ලදී.

එසේම, ගෙවතු වගාවන් සඳහා ජනතාව දිරිගැන්වූ අතර එමඟින් දිස්ත්‍රික්කයේ බැමි වගාව හා අන්තර් කන්න වගා කටයුතු සිදුකරන ලදී. එමඟින් පළතුරු හා එළවළු ලබා ගැනීමේ හැකියාව ඉහළ නංවන ලදී. එසේම කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීමට නියර වගාවද සිදුකරන ලදී.

මෙයට අමතරව වී ගොවීන් 25000 ක් සඳහා එළවළු බීජ පැකට්ටු 25000 ක් බෙදා දුන් අතර එම බීජ අතර බණ්ඩක්කා, බුෂිටා මෑ, මෑ කරල්, කරවිල, තම්පලා බීජ විය. මෙම ව්‍යාපෘතියේ සමස්ථ වියදම රුපියල් මිලියන 05 ක් විය.

ඉන්ධන නොමැති වීම, හිඟතාව කෘෂිකාර්මික කටයුතු සඳහා සෘණාත්මකව බලපෑ අතර ජනතාව තුළ නොසන්සුන්තාවයක් ඇතිකරන ලදී. කෙසේ වෙතත් මහජව නොසන්සුන්තාව කළමනාකරණය කර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි වූ අතර කෘෂිකාර්මික හා ධීවර අවශ්‍යතා සඳහා අවශ්‍ය වූ ඉන්ධන ලබා දීමට හැකි විය.

තවද පොහොර ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් ගොවීන් අතර නොසන්සුන්තාවයක් උද්ගත වූ අතර එම තත්ත්වය ද සාර්ථකව කළමනාකරණය කර ගැනීමට හැකි විය. ඒ යටතේ අවශ්‍ය පොහොර සපයා ගැනීම සඳහා කෘෂිකාර්මික අමාත්‍යාංශය සමඟ හා අදාළ බලධාරීන් සමඟ නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි විය.

03. දිස්ත්‍රික්කයේ සහය අවැසි ජනතාව සඳහා සහය වීමේ වැඩසටහන් දේශීය හා විදේශීය ආධාර යටතේ සාර්ථකව ක්‍රියාත්මක විය.

මේ යටතේ මහඔය, නාවිදන්වේලි, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ලෝක ආහාර වැඩසටහන යටතේ මූල්‍ය සහයෝගිතා හා ආහාර සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක විය. ලෝක ආහාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන්හි ප්‍රගතිය පහත පරිදි විය.

ලෝක ආහාර වැඩසටහන, මූල්‍ය සහය වැඩසටහන ප්‍රගතිය (2022.12.31 දිනට)

#	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ගෙවීම් කරන ලද ගෘහ ඒකක ගණන	ගෙවූ මුදල (රු.මිලියන)
1	මහඔය	2,469	37.04
2	නාවිදන්වේලි	3,028	45.42
3	පදියතලාව	2,147	32.21
එකතුව		7,644	114.67

ලෝක ආහාර වැඩසටහන, ආහාර සහයෝගිතා වැඩසටහන ප්‍රගතිය (2022.12.31)

#	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	අනුමත ගෘහ ඒකක	ලැබුණු ආහාර ද්‍රව්‍ය			බෙදා දෙන ලද ආහාර ද්‍රව්‍ය		
1	නාවිදන්වේලි	3,201	160.05	64.02	14.405	159.6	63.84	14.36
2	මහඔය	2,713	135.65	54.26	12.209	132.8	53.12	11.95
3	පදියතලාව	4,292	214.6	85.84	19.314	213.95	85.58	19.26
එකතුව		10,206	510.3	204.12	45.927	506.35	202.54	45.57

- සහල් 50Kg, පරිප්පු 20Kg, තෙල් 4.5Kg එක් පවුලක් සඳහා පරිත්‍යාග කෙරුණි.
- සහල් මෙ.ටොන් 3.95, පරිප්පු මෙ.ටොන් 1.58, තෙල් මෙ.ටොන් 0.356 ක් බෙදා දීමට ඉතුරුව ඇත.

යුනිසෙක් සංවිධානයේ අරමුදලක් සහයෝගීතාවය මත මුල් ළමාවිය මධ්‍යස්ථානවල දරුවන් සඳහා පෝෂ්‍යදායී උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනක් 2022 වසරේ සැප්තැම්බර්, ඔක්තොම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි ක්‍රියාත්මක විය. ඉලක්කගත ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව 5031 ක් වූ අතර ඒ යටතේ රුමිලියන 32.93 ක වියදමක් දරණ ලදී.

පෝෂණ අවශ්‍යතා සහිත තෝරාගත් ප්‍රතිලාභීන් 2106 ක් සඳහා හරිත කෘෂිකර්ම ක්‍රියාන්විත මධ්‍යස්ථානය සහ ෆොන්වේරා ලංකා සමාගම හා එක්ව ඇන්කර් වර්ගයේ ග්‍රෑම් 400 කිරිපිටි පැකට් 4212 ක් බෙදා දෙන ලදී.

2022 වර්ෂයේදී මුහුණ දුන් අභියෝග

2022 වර්ෂයේ ඉලක්ක සාක්ශාත් කර ගැනීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දුන් අතර එම අභියෝගයන් බොහෝදුරට කළමනාකරණය කර ගැනීමට හැකි විය.

1. මෙම දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රයේ නියුතු ජනතාව ඉන්ධන හා ගෑස් හිඟය හමුවේ එදිනෙදා කටයුතු ඉටුකර ගැනීමේදී දැඩි බලපෑමකට ලක්විය. මෙම තත්ත්වය හමුවේ ඇති වූ මහජන නොසන්සුන්තාව සමනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ එක්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ඉන්ධන හා ගෑස් බෙදාහැරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.
2. මෙරට ඇති වූ ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන “ගම සමඟ පිළිසඳර” වැඩසටහන ක්‍රියාත්මක කිරීම වසරේ පළමු කාර්තුවට සීමා විය.
3. මිල ගණන් අධික ලෙස ඉහළ යාම හා අමුද්‍රව්‍ය ආනයනය සීමා වීම වැනි හේතු මත ආරම්භයේදී එකඟ වූ මිල ගණන් අනුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත්කරුවන් එකඟ නොවීම මත බොහෝ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

4. රටෙහි පැවති ආර්ථික අවපාත තත්ත්වය හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජනතාව, ආදයම් පහළ යාම, පෝෂ්‍යදායී ආහාර සපයා ගැනීමට අපහසුවීම වැනි දුෂ්කරතාවලට මුහුණ දුන් අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ එක්ව විදේශීය හා දේශීය ආයතන සමඟ සහයෝගීත්වයෙන් එවැනි තත්ත්වයන් මඟහරවා ගැනීමට අවශ්‍ය සහය ලබා දෙන ලදී.

5. නියමිත අවස්ථාවේදී සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් නොමැති වීම හා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා භාණ්ඩ වෙළඳසැල තුළ සපයා ගැනීමට අපහසුවීම ආදී කරුණු මත සමහර ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති පළමු කාර්තුව තුළ ක්‍රියාත්මත කිරීමට නොහැකි විය.

2023 වසර සඳහා සැලසුම්

රටෙහි ආර්ථික සංවර්ධනයට දායක ලබා දීම හා දිස්ත්‍රික්කයේ අඩු ආදායම් ලාභීන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමත් අරමුණෙන් ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය ඉහළ නැංවීම පෙරදැරිව පහත සැලසුම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

1. ආහාර සුරක්ෂිතතා හා පෝෂණ වැඩසටහන 2023 වසර තුළද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර එමඟින් ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දුන් ජනතාව සඳහා එදිනෙදා පෝෂණ අවශ්‍යතා සපුරාලීමට තිරසාර ගෙවතු 12575 ක් ඇති කිරීමට සැලසුම් කර ඇති අතර එමඟින් ස්වයංපෝෂිභාවය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.
2. අතහැර දමා ඇති ඉඩම් වගා කටයුතු සඳහා යොදවා ගැනීම, ඉඩම් අවභාවිතය වැළැක්වීම වැනි ක්‍රියාමාර්ග ගැනීම තුළින් දිස්ත්‍රික්කයේ ඉඩම් උපරිමව ප්‍රතිලාභ ලැබෙන පරිදි භාවිතා කිරීමට අදාළව කටයුතු කිරීම.
3. මුං ඇට, උඳු හා රටකජු වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා දිස්ත්‍රික් දායකත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. වගා බිම්වල ආරක්ෂාව සඳහා මහා පරිමාණ ගෙවීන් සඳහා වායු රයිෆල් ලබා දීමට අපේක්ෂිතය.
4. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර එමඟින් කාන්තා හා තරුණ ව්‍යාපාරිකයින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දායකත්වයෙන් සවිබල ගැන්වීමට අපේක්ෂිතය. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20 ආවරණය වන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 100 ක් ඇති කිරීමට මෙන්ම අපනයනය ඉලක්කගත කාර්මික හෝ කෘෂිකාර්මික ව්‍යාපෘති 20 ක් ඇරඹීමට ද යෝජිතය.
5. දිස්ත්‍රික්කයේ ජනතාවගේ දිළිඳුභාවය තුරන් කිරීම සඳහා පවුල් 503 ක ආර්ථිකය ඉහළ නංවාලීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ම ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අපේක්ෂිතය.
6. දිස්ත්‍රික්කයේ පරිසර සංරක්ෂණය තහවුරු කිරීම පිණිස වන වගා වැඩසටහන් 20 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
7. අලි මිනිස් ගැටුම අවම කිරීමට විදුලි වැට දිගු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිත අතර එමඟින් වගාවන්, මිනිස් ජීවිත මෙන්ම වන අලින්ගේ ජීවිතත් සුරක්ෂිත කිරීම අපේක්ෂා කෙරේ.
8. දිස්ත්‍රික්කයේ ගර්භණී මාතාවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නංවාලීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ගේ පෝෂණ මට්ටම වර්ධනය කිරීම සඳහා කැපකරු මාපිය ක්‍රමයක් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.
9. දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර විවිධ හේතු මත පාසල් අධ්‍යාපනය අතහැර ඇති සිසුන් 503 ක් නැවත පාසල් වෙත යොමු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් අවම වශයෙන් 503 ක් පුනරුත්තාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීමට සැලසුම් කර ඇත.

ජේ.එම්.ඒ.ඩග්ලස්,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එස්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	කණ්ඩායම 2022	2021	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිමි		4,929,631,000	4,744,133,000	ඒසිඒ-3
-	තැන්පතු		502,211,204	411,124,440	ඒසිඒ-4
50,000,000	අත්තිකාරම් ගිණුම්		64,040,672	62,172,640	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		19,505	-	
50,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**5,495,902,381**	5,217,430,080	
50,000,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**5,495,902,381**	5,217,430,080	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		43,642,547	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		5,452,259,834	5,217,430,080	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,096,500,000	වැටුප් , වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,069,390,882	926,830,335	
175,100,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	169,038,058	133,500,465	ඒසිඒ-2(ii)
4,400,000	සහනාධාර , ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,498,914	333,241,486	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,276,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**1,241,927,854**	**1,393,572,286**	
	මූලධන වියදම්				
16,900,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	19,564,612	17,608,631	
28,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	27,942,223	57,178,718	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,100,000	හැකියා වර්ධනය	14	763,410	842,590	
472,000,000	වෙනත් මූලධන වියදම්	15	459,836,461	-	
518,000,000	මුළු මූලධන වියදම් (උ)		**508,106,706**	**75,629,940**	
	තැන්පතු ගෙවීම්		588,271,350	454,551,929	ඒසිඒ-4
70,000,000	අත්තිකාරම් ගෙවීම්		66,190,570	54,133,289	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		21,505	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**654,483,425**	**508,685,218**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,404,517,984	1,977,887,444	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**3,047,741,850**	**3,239,542,636**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		3,047,741,850	3,239,542,636	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර
2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	3,718,140,211	3,423,420,682
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	203,845,266	201,695,368
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**3,921,985,477**	**3,625,116,050**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		124,280,447	36,070,403
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,718,140,211	3,423,420,682
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	79,564,819	165,624,965
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**3,921,985,477**	**3,625,116,050**

පිටු අංක 7 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 36 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරී
නීල් බණ්ඩාර හපුහින්න,	ජේ.එම්.ඒ. ඩග්ලස්	එස්.එල්.ආදම්බාවා
ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	දිස්ත්‍රික් ලේකම්	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2023.02. 22	දිනය : 2023.02.	දිනය : 2023.02. 20

ජේ.එම්.ඒ. ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		ඒසිඒ -සී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර		
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තක්සා	
	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	282,451,089	318,688,155
අග්‍රිම ලැබීම්	4,929,631,000	4,744,133,000
අත්තිකාරම් අයකර ගැනීම්	85,305,672	79,785,572
තැන්පතු ලැබීම්	502,211,204	411,124,440
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**5,799,598,965**	**5,553,731,167**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,237,114,945	1,060,268,735
සහනාධාර සහ මාරුකිරීම්	3,498,914	333,241,486
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,324,266,700	3,555,365,455
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	43,642,547	-
අත්තිකාරම් ගෙවීම්	94,697,803	74,673,623
තැන්පතු ගෙවීම්	588,271,350	454,551,929
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**5,291,492,259**	**5,478,101,228**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**508,106,706**	**75,629,940**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
ගැනීම්	508,106,706	75,629,940
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**508,106,706**	**75,629,940**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(508,106,706)**	**(75,629,940)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0.00)**	**(0.00)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(0.00)**	**(0.00)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒසිඒ - 1

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ගණන්දීමේ නිලධාරී : දිස්ත්‍රික් ලේකම්

වියදම් ශීර්ෂ අංකය : 270

රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම් (4)			(5)
		මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම	වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21)	එකතුව	හිඟ ආදායම් රැස්කිරීම	මුදලින්	වැරදි නිවැරදි කිරීම	එකතුව	ශුද්ධ ආදායම
		1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+ 4(ii)	5=2(iii)+(3)-4(iii)
					අදාළ නොවන						
	මුළු එකතුව										

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2023.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

ආදායම් ගණන් දීමේ නිලධාරී
ජේ.එම්.ඒ.ඩබ්ලස්
දිස්ත්‍රික් ලේකම්
දිනය : 2023.02.

ජේ.එම්.ඒ. ඩබ්ලස්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 270

අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

රු.

වැය විෂයය	සටහන	ප්‍රතිපාදනය					වියදම			ශුද්ධ බලපෑම		
		මූල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	9=(8)/(4)*100	
පුනරාවර්තන වියදම්												
වැඩසටහන (1)												
වැඩසට./ව්‍යාපෘ ./උප ව්‍යාපෘ ./වැය විෂයය අංකය												
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප් , වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5											
පුද්ගල පඩිනඩි												
1001 වැටුප්හා වේතන			698,000,000	-	(1,500,000)	696,500,000	687,319,590	-	687,319,590	9,180,410	1	අනියම් ඉතිරි කිරීම්
1002 අතිකාල හා නිවාඩු දිනවැටුප්			45,500,000	-	-	45,500,000	42,417,787	-	42,417,787	3,082,213	7	වියදම් පාලනය
1003 වෙනත් දීමනා			353,000,000	-	(1,500,000)	351,500,000	338,337,510	1,315,995	339,653,505	11,846,495	3	අනියම් ඉතිරි කිරීම්
එකතුව			**1,096,500,000**	-	**(3,000,000)**	**1,093,500,000**	**1,068,074,887**	**1,315,995**	**1,069,390,882**	**24,109,118**		
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා	6									-		
ගමන් වියදම්										-		
1101 දේශීය		11	19,800,000	-	-	19,800,000	19,767,008	-	19,767,008	32,992	0	ඉන්ධන අර්බුධය හමුවේ ක්ෂේත්‍ර රාජකාරි අඩු වීම
එකතුව (අ)			**19,800,000**	-	-	**19,800,000**	**19,767,008**	-	**19,767,008**	**32,992**		
සැපයීම්										-		
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා		11	17,800,000	-	-	17,800,000	17,796,275	-	17,796,275	3,725	0	අනියම් ඉතිරි කිරීම්
1202 ඉන්ධන		11	34,940,000	-	-	34,940,000	33,821,531	-	33,821,531	1,118,469	3	ඉන්ධන අර්බුධය හමුවේ ක්ෂේත්‍ර රාජකාරි අඩු වීම
1203 ආහාර පාන හා නිල ඇඳුම්		11	460,000	-	-	460,000	262,000	-	262,000	198,000	43	සුදුසුකම්ලාභී අයදුම්කරුවන් අඩු වීම.
1205 වෙනත්		11	-	-	-	-	-	-	-	-		
එකතුව (ආ)			**53,200,000**	-	-	**53,200,000**	**51,879,806**	-	**51,879,806**	**1,320,194**		
නඩත්තු වියදම්										-		
1301 වාහන		11	21,000,000	-	-	21,000,000	20,017,956	-	20,017,956	982,044	5	වියදම් පාලනය
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ		11	6,200,000	-	-	6,200,000	6,130,016	-	6,130,016	69,984	1	වියදම් පාලනය
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		11	16,500,000	-	-	16,500,000	16,371,975	-	16,371,975	128,025	1	වියදම් පාලනය
එකතුව (ඇ)			**43,700,000**	-	-	**43,700,000**	**42,519,947**	-	**42,519,947**	**1,180,053**		
සේවා										-		
1401 ප්‍රවාහන		11	600,000	-	-	600,000	600,000	-	600,000	-	-	
1402 තැපැල් හා සන්නිවේදන		11	9,200,000	-	-	9,200,000	7,923,053	-	7,923,053	1,276,947	14	ඉන්ධන අර්බුධය හමුවේ කාර්යාල
1403 විදුලිය හා ජලය		11	17,600,000	-	-	17,600,000	16,136,059	-	16,136,059	1,463,941	8	සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවීම
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු		11	1,000,000	-	-	1,000,000	484,214	-	484,214	515,786	52	
1409 වෙනත්		11	30,000,000	-	-	30,000,000	29,727,971	-	29,727,971	272,029	1	වියදම් පාලනය
එකතුව (ඈ)			**58,400,000**	-	-	**58,400,000**	**54,871,298**	-	**54,871,298**	**3,528,702**	6	
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)			**175,100,000**	-	-	**175,100,000**	**169,038,058**	-	**169,038,058**	**6,061,942**		
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම් , ප්‍රදානයන් සහ සහනාධාර	7									-		
මාරුකිරීම්										-		
1501 සුභසාධන වැඩසටහන්		11	-	-	-	-	-	-	-	-		
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී		11	4,400,000	-	-	4,400,000	3,498,914	-	3,498,914	901,086	20	දේපළ ණය සඳහා අයදුම් නොකිරීම.
එකතුව										-		
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම්	9									-		
1701 පාඩු සහ කපාහැරීම්		11	-	-	-	-	-	-	-	-		
එකතුව										-		
වැඩසටහන (1)										-		
මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)			**1,276,000,000**	-	**(3,000,000)**	**1,273,000,000**	**1,240,611,859**	**1,315,995**	**1,241,927,854**	**31,072,146**		

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 270

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

රු.

විෂය විෂයය	සටහන	ප්‍රතිපාදනය					වියදම			ඉතිරිය		
		මුල්‍යකරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරු කිරීම (3) (-)/+	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොතට අනුව වියදම (5)	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංගෝධිත ඇස්තමේන්තුවේ % ලෙස 9=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
මුලධන වියදම්										-		
හැඩසවහන (1)										-		
විෂය විෂයය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය										-		
මුලධන වත්කම් ප්‍රනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10									-		
2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		11	10,400,000	-	3,000,000	13,400,000	13,393,188	-	13,393,188	6,812	0	අනියම් ඉසිරි කිරීම
2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		11	2,000,000	-	-	2,000,000	1,908,709	-	1,908,709	91,291	5	ගෙවීම් කිරීම සඳහා අවශ්‍යතාවයක් ඇති
2003 වාහන		11	4,500,000	-	-	4,500,000	4,262,716	-	4,262,716	237,284	5	නොවීම.
එකතුව (අ)			**16,900,000**	**-**	**3,000,000**	**19,900,000**	**19,564,612**	**-**	**19,564,612**	**335,388**		
මුලධන වත්කම් අත්පත් කර ගැනීම්	11									-		
2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ		11	4,000,000	-	-	4,000,000	3,974,100	-	3,974,100	25,900	1	අනියම් ඉසිරි කිරීම
2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		11	4,000,000	-	-	4,000,000	3,979,813	-	3,979,813	20,188	1	අනියම් ඉසිරි කිරීම
2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		11	20,000,000	-	-	20,000,000	19,988,310	-	19,988,310	11,690	0	
එකතුව (ආ)			**28,000,000**	**-**	**-**	**28,000,000**	**27,942,223**	**-**	**27,942,223**	**57,777**		
හැකියා වර්ධනය	14									-		
2401 කාර්ය මණ්ඩල සුභසාධන		11	1,100,000	-	-	1,100,000	763,410	-	763,410	336,590	31	ගෙවීම් කිරීම සඳහා අවශ්‍යතාවයක් ඇති
එකතුව (ඉ)			**1,100,000**	**-**	**-**	**1,100,000**	**763,410**	**-**	**763,410**	**336,590**		නොවීම.
වෙනත් මුලධන වියදම්	15									-		
2509 වෙනත්		11	472,000,000	-	-	472,000,000	459,836,461	-	459,836,461	12,163,539	3	
එකතුව (ඊ)			**472,000,000**	**-**	**-**	**472,000,000**	**459,836,461**	**-**	**459,836,461**	**12,163,539**		
හැඩසවහන (1)												
රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ)			518,000,000	-	3,000,000	521,000,000	508,106,706	-	508,106,706	12,893,294		
මුළු වියදම්වල එකතුව (සටහන 5-15)			1,794,000,000	-	-	1,794,000,000	1,748,718,565	1,315,995	1,750,034,560	43,965,440		

.....

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2023.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

2022 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

වියදම් ශීර්ෂ අංකය : 270

රු.

අග්‍රිම ගිණුම් අංකය	2022 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය			අග්‍රිම ලැබීම්			අග්‍රිම පියවීම්			2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			2022 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය	2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
	1			2			3			4				
	නොපියවූ උප අග්‍රිම	නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම් මඟින්	මුදල් මඟින්	එකතුව	නොපියවූ උප අග්‍රිම ශේෂය	නොපියවූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
7002/0/0/288/0/22	-	-	-	4,929,631,000	626,687,402	5,556,318,402	5,556,318,402	-	5,556,318,402	-	-	-	-	-

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2022.12.31 දිනට මුදල් ශේෂය .....

(2) වෙනත් හේතු - ....

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.....

ප්‍රධාන ගණකාධිකාරී

එස්.එල්.ආදම්බාවා,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

දිනය : 2023.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

19

2022 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 270

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

තැන්පතු ගිණුමේ නම	තැන්පතු අංකය	2022 ජනවාරි 01 දිනට ශේෂය	වර්ෂය තුළ බැර කිරීම්	වර්ෂය තුළ හර කිරීම්	2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
		Rs.	Rs.	Rs.	Rs.	Rs.
තැන්පතු ගිණුමේ නම						
(i) ඇප තැන්පත්	6000/0/0/0001/0089	4,410,605	5,902,011	7,931,660	2,380,956	**2,380,956**
(ii) ටෙන්ඩර් තැන්පත්	6000/0/0/0002/0119	2,732,527	604,780	3,218,307	119,000	**119,000**
(iii) පළාත් සභා වෙත ආදායම් ප්‍රේෂණය කිරීම	6000/0/0/0014/0013	12,951,021	64,114,159	72,254,790	4,810,389	**4,810,389**
(iv) කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල්	6000/0/0/0016/0067	68,641,643	61,395,604	87,015,170	43,022,077	**43,022,077**
(v) වන්දි ගෙවීම්	6000/0/0/0017/0020	-	-	-	-	**-**
(vi) වියදම් ප්‍රතිපූරණය සඳහා අරමුදල් ලැබීම	6000/0/0/0020/0011	76,889,168	370,194,650	417,851,422	29,232,396	**29,232,396**
මුළු එකතුව		**165,624,965**	**502,211,204**	**588,271,350**	**79,564,819**	**79,564,819**

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2023.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 270 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

රු.

අත්තිකාරම් ගිණුමේ නම	අත්තිකාරම් ගිණුම් අංකය	අත්තිකාරම් ගිණුම් සංඛ්‍යාව	2022 ජනවාරි 01 දිනට ශේෂය (1)	වියදමෙහි උපරිම සීමා රු.		ලැබීම්වල අවම සීමා රු.		හර ශේෂයන්ගේ උපරිම සීමා රු.	බැරකම් පිළිබඳ උපරිම සීමා රු.	2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
				වර්ෂය තුළ හර කිරීම (2)		වර්ෂය තුළ බැර කිරීම (3)		ශේෂය 4=(1)+(2)-(3)		
				මුදලින්	හරස් සටහන් මගින්	මුදලින්	හරස් සටහන් මගින්			
(1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්	8493/0/0/270/27001	20	201,695,368.00	61,985,068.00	4,205,502.00	57,725,915.00	6,314,758.00	203,845,266.00	-	203,845,266.00
(2) අනෙකුත් අත්තිකාරම්	7000/0/0/250/0/3/0	-	-	-	-	-	-	-	-	-

.....

ප්‍රධාන ගණකාධිකාරී
එස්.එල්.ආදම්බාවා,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිනය : 2023.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

21

ACA-6

Non Financial Asset Acct Summary for the Month of December 2022

To

District Secretariat Ampara (270)

From

Director General, ,
Department of State Accounts, ,

General Treasury, Colombo1.

Printed By **Huzainca2017**

New Table No **:SA-80**

Old Table No :BTBL 72A

Report Date 2/17/2023 9:27:50 AM



Head	Code	Opn_Bal	Upto_Last_Month	Current_DR	Current_CR	Clsn_Balance
270	9152-0-0-270-0-0-0	661,191,395.59	-600,645.35	2,289,546.25	218,000.00	662,662,296.49
270	9153-0-0-270-0-0-0	1,479,609,000.00	202,200,000.00	0.00	0.00	1,681,809,000.00
270	9160-0-0-270-0-0-0	59,758,515.56	17,802,970.08	0.00	0.00	77,561,485.64
270	9151-0-0-270-0-0-0	1,222,861,770.84	71,060,318.39	2,185,340.04	0.00	1,296,107,429.27

This is a computer-generated document. No signature is required.

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2022

Land-9153: 1,681,809,000.00 Table: SA 82
Building- 9151: 1,296,107,429.27 Year: 2022
Machinary-9152: 662,662,296.49 Rpt Date 2/17/2023 9:29:06 AM
WIP-9160: 77,561,485.64 Head 270
Intangible-9154: 0.00
Lease-9180: 0.00

Ledger	category	Item	Code	Opn_Bal	Opn_Bal_Add	TransferIn	Purchase	Disposal	Balance
9151	1.1-Dwellings		61111	375,058,866.65	0.00	0.00	0.00	0.00	375,058,866.65
		Garages	****6111102	3,028,077.62	0.00	0.00	0.00	0.00	3,028,077.62
		Hotels & Restaurants	****6111106	2,581,118.43	0.00	0.00	0.00	0.00	2,581,118.43
		Quarters	****6111107	350,379,670.60	0.00	0.00	0.00	0.00	350,379,670.60
		Circuit Bunglows	****6111108	19,070,000.00	0.00	0.00	0.00	0.00	19,070,000.00
9151	1.2-Non Residential Building		61112	844,112,258.68	104,000,000.00	0.00	2,185,340.00	29,249,036.06	921,048,562.62
		Office Building	****6111201	838,659,315.08	104,000,000.00	0.00	2,185,340.00	29,249,036.06	915,595,619.02
		Building for Public Entertainment	****6111204	5,452,943.60	0.00	0.00	0.00	0.00	5,452,943.60

9160	1.4-WIP-Building & Structure		61114	59,758,515.56	0.00	0.00	17,802,970.08	0.00	77,561,485.64
		WIP-Building & Structure	****611140	47,320,275.71	0.00	0.00	14,642,812.50	0.00	61,963,088.21
		Building for Public Entertainment	****6111411	860,344.35	0.00	0.00	0.00	0.00	860,344.35
		Office Building	****611148	11,577,895.50	0.00	0.00	3,160,157.58	0.00	14,738,053.08
9152	2.1-Transport Equipment		61121	289,058,500.00	0.00	0.00	0.00	0.00	289,058,500.00
		Passenger vehicle	****6112101	279,508,500.00	0.00	0.00	0.00	0.00	279,508,500.00
		Agricultural vehicle	****6112103	9,145,000.00	0.00	0.00	0.00	0.00	9,145,000.00
		Motor cycle	****6112109	405,000.00	0.00	0.00	0.00	0.00	405,000.00
9152	2.2-Other Machinary & Equipment		61122	370,912,102.59	4,544,307.45	0.00	6,220,182.50	8,072,796.05	373,603,796.49
		Office Equipment	****6112201	42,019,196.00	491,350.00	0.00	184,840.50	1,272,400.00	41,422,986.50
		Computer Equipment	****6112202	109,833,028.10	2,641,239.00	0.00	3,207,690.00	3,797,133.00	111,884,824.10
		Electrical Equipment	****6112203	54,552,746.75	246,970.00	0.00	1,127,455.00	1,104,108.00	54,823,063.75
		Communication Equipment	****6112204	14,634,396.27	196,400.00	0.00	212,865.25	193,900.00	14,849,761.52
		Furniture	****6112205	148,634,976.47	916,898.45	0.00	1,487,331.75	1,705,255.05	149,333,951.62
		Musical Instruments	****6112206	0.00	51,450.00	0.00	0.00	0.00	51,450.00

		Sports equipment	****6112208	12,200.00	0.00	0.00	0.00	0.00	12,200.00
		Paintings Sculptures & other Antiques	****6112209	6,400.00	0.00	0.00	0.00	0.00	6,400.00
		Books Periodical & Journals	****6112210	8,100.00	0.00	0.00	0.00	0.00	8,100.00
		Laboratory Instruments	****6112211	59,200.00	0.00	0.00	0.00	0.00	59,200.00
		Industrial & Manufacturing Equipment	****6112212	26,000.00	0.00	0.00	0.00	0.00	26,000.00
		Construction Eqipment	****6112213	9,450.00	0.00	0.00	0.00	0.00	9,450.00
		Broadcasting Equipment	****6112214	860,545.00	0.00	0.00	0.00	0.00	860,545.00
		Defence Equipment	****6112215	4,000.00	0.00	0.00	0.00	0.00	4,000.00
		Agricultural & Dairy Farm Equipment	****6112216	247,364.00	0.00	0.00	0.00	0.00	247,364.00
		Fire Protection Equipment	****6112217	4,500.00	0.00	0.00	0.00	0.00	4,500.00
9153	4.1-Land		61410	1,479,609,000.00	202,200,000.00	0.00	0.00	0.00	1,681,809,000.00
		Land	****614100	1,479,609,000.00	202,200,000.00	0.00	0.00	0.00	1,681,809,000.00

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

වෙනත් **ආයතන** විසින් , **වාර්තාකරණ ආයතනය** වෙතුවෙන් එකතු කරන ලද ආදායම	-	
අනෙකුත් **ශීර්ෂ** වෙතුවෙන් **වාර්තාකරණ ආයතනය** විසින් දරන ලද වියදම්	3,324,266,700	
අනෙකුත් **ශීර්ෂ වෙතුවෙන් වාර්තාකරණ ආයතනය** විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙතුවෙන් කරන ලද හර කිරීම්	28,507,233	
අනෙකුත් **ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	4,999,415	3,357,773,348
අඩු කළා :		
අනෙකුත් **ආදායම් ශීර්ෂ** වෙතුවෙන් , **වාර්තාකරණ ආයතනය** විසින් එකතු කරන ලද ආදායම්	282,451,089	
වෙනත් **ආයතන** විසින් , **වාර්තාකරණ ආයතනය** වෙතුවෙන් දරන ලද වියදම්	1,315,995	
අනෙකුත් **ශීර්ෂ වෙතුවෙන් වාර්තාකරණ ආයතනය** විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙතුවෙන් කරන ලද බැර කිරීම්	25,895,946	
අනෙකුත් **ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්	368,468	310,031,498
2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**3,047,741,850**

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
10.03.07.02	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ ලියාපදිංචි ගාස්තු			33,134,286.00	-
10.03.07.03	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම			477,509.36	-
10.03.07.05	ආරක්ෂක අමාත්‍යාංශයට අයත් බලපත්‍ර ගාස්තු	265,000.00	265,000.00	258,590.00	97.58
10.03.07.99	වෙනත් (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා)	7,000,000.00	6,000,000.00	4,103,741.01	68.40
20.02.01.01	රජයේ ගොඩනැගිලි සහ නිවාස කුලියට දීම	3,250,000.00	3,250,000.00	2,880,884.74	88.64
20.02.01.03	ඉඩම් ආදායම් හා වෙනත් ආදායම්	-	-	22,812,563.85	-
20.02.02.99	පොලී සහ වෙනත්	12,500,000.00	12,500,000.00	10,556,915.82	84.46
20.03.01.00	දෙපාර්තමේන්තු විකුණුම්	-	-	-	-
20.03.02.13	විභාග සහ වෙනත් ගාස්තු	-	-	35,185	-
20.03.02.14	මෝටර් රථවාහන පනත සහ වෙනත් කුවිතාන්සි යටතේ ගාස්තු	-	-	82,919,580.00	-
20.03.02.03	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	-	7,409,650.00	-
20.03.02.99	විවිධ භාණ්ඩ	2,750,000.00	1,500,000.00	441,638.41	29.44
20.03.07.00	වී අලෙවිය	-	-	-	-
20.03.99.00	වෙනත් කුවිතාන්සි	19,500,000.00	15,000,000.00	37,522,520.96	250.15
20.04.01.00	මධ්‍යම රජයේ ආදායම්	-	-	76,764,715.34	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ඒඅයිඒ -2

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 270

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	1,276,000,000	-	(3,000,000)	1,273,000,000	1,241,927,853	31,072,147
	(2) ප්‍රාග්ධන	518,000,000	-	3,000,000	521,000,000	508,106,706	12,893,294
	මුළු එකතුව	1,794,000,000	-	-	1,794,000,000	1,750,034,559	43,965,441

.....

ප්‍රධාන ගණකාධිකාරී

එස්.එල්.ආදම්බාවා,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

දිනය : 2023.02.

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-2-5-23-2104 සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම (මහඔය, උහන, සායින්දමරුදු)	19,781,398.00	19,781,398.00	17,983,596.80	90.91
2		101-2-6-1-2205 ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පරිපාලන වියදම් (පොතුවිල් මුහුදු මහා විහාරය)	475,000.00	475,000.00	-	0.00
3		101-2-6-8-2205 නොදියුණු විහාරස්ථාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන - 2022	7,546,623.00	7,546,623.00	1,546,623.00	20.49
4		101-2-6-9-2205 තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන	176,500.00	176,500.00	101,500.00	57.51
5		101-2-9-1-2202 පදියදොර විහාරස්ථානයේ ශ්‍රී මහාබෝධි විහාරයේ වැට ඉදිකිරීම	1,000,000.00	1,000,000.00	1,000,000.00	100.00
6	ආරක්ෂක අමාත්‍යාංශය- ආපදා කළමනාකරණ අංශය	103-2-17-2-2509 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (අතැති බිල්පත්)	5,356,972.74	5,356,972.74	5,356,972.74	100.00
7		103-2-18-7-2506 නිවාස හානි සඳහා වන්දි	9,563,037.95	9,563,037.95	7,376,896.95	77.14

8	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	110-1-4-5-2202 සංහිදියාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	660,000.00	660,000.00	655,215.00	99.28
9		110-1-5-19-2509 ජාතික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	1,742,890.00	1,742,890.00	1,460,369.00	83.79
10	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-02-15-011-2509-062(11) වකුගඩු රෝග පාලනය කිරීමේ වැඩසටහන	1,264,800.00	1,264,800.00	1,196,192.76	94.58
11	කෘෂිකර්ම අමාත්‍යාංශය	118-2-20-3-2202එළවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය	7,948,080.00	7,948,080.00	7,887,632.82	99.24
12		118-2-20-4-2202 උළු, මුං සහ ඉඟුරු වගා ව්‍යාපෘතිය	7,948,080.00	7,948,080.00	7,208,130.50	90.69
13		118-2-23-1-1504 පොහොර සහනාධාරය 2022/2023	893,415,900.00	893,415,900.00	309,868,384.55	34.68
14		118-2-23-7-2509 ජාතික ආහාර සුරක්ෂිතතා වැඩසටහන	5,125,000.00	5,125,000.00	5,112,990.00	99.77
15	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	122-2-3-5-2105 ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි	21,355,000.00	21,355,000.00	21,355,000.00	100.00
16	කර්මාන්ත අමාත්‍යාංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය	126-1-15-1-2205 ශ්‍රී ඥානතිස්ස දහම් පාසලේ සංවර්ධන කටයුතු	475,013.00	475,013.00	475,013.00	100.00
17		126-2-19-30-2509 විදාතා සම්පත් මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම	2,672,090.00	2,672,090.00	2563715.93	95.94
18		126-2-21-12-2001 වෘත්තීය අධ්‍යාපන ප්‍රවර්ධන සහ ආයතනවල භෞතික සම්පත් සංවර්ධන වැඩසටහන	7,973,938.10	7,973,938.10	7,973,938.10	100.00
19		126-2-5-2-2001 පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම	490,155.00	490,155.00	-	0.00
20	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	130-1-13-1-2509 ත්‍රෛභාෂා වැඩසටහන	370,000.00	370,000.00	370,000.00	100.00

21	ජල සම්පාදන අමාත්‍යාංශය	166-2-16-3-2506 ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන - (SACOSAN)	3,000,000.00	3,000,000.00	3,000,000.00	100.00
22	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය	171-2-6-7-2509 “දිරිය මංපෙත“ වැඩසටහන	1,055,699.00	1,055,699.00	1,055,699.00	100.00
23	වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග කළමනාකරණ අංශය	198-02-03-0-2001 RPM කාර්යාලය (ගල්ඔය වම් ඉවුර) ප්‍රතිසංස්කරණය කිරීම	26,939.87	26,939.87	25,847.82	95.95
24	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	228-1-1-0-2001 අධිකරණවල සුළු අලුත්වැඩියාවන් සහ කුඩා ඉදිකිරීම්	4,891,830.45	4,891,830.45	4,815,901.75	98.45
25	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	248-1-1-0-2001 මුළුතැන්ගෙය සඳහා Exhaust Fan / Exhaust Hood සවි කිරීම. (සුරාබදු ස්ථානය-අම්පාර)	133,621.00	133,621.00	105,660.00	79.07
26	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	290-01-01-0-1303 කල්මුණ දිස්ත්‍රික් කාර්යාලයේ ජල සැපයුම අළුත්වැඩියා කිරීම	150,000.00	150,000.00	141,201.00	94.13
27	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	327-2-1-0-2507 සංවර්ධන වැඩසටහන්	612,380.00	612,380.00	593,582.50	96.93
28		327-2-1-0-2509 සංවර්ධන වැඩසටහන්	201,615.00	201,615.00	190,260.00	94.37
29	මිනිස්බල සහ රැකිරක්ෂා දෙපාර්තමේන්තුව	328-2-1-2-2509 ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	102,400.00	102,400.00	54,930.00	53.64

3.8 **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,296,107,429.27	1,296,107,429.27	-	100%
9152	යන්ත්‍රෝපකරණ	662,662,296.49	662,662,296.49	-	100%
9153	ඉඩම්	1,681,809,000.00	1,681,809,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	77,561,485.64	77,561,485.64	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
EPCG/AM/A/Dis.Sec/02/SR/02/2023/01
ඔබේ අංකය
உமது இல.
Your No.
දිනය
திகதி
Date
26 May 2023

District Secretary,
District Secretariat,
Ampara

Summary Report of the Auditor General on the Financial Statements of the District Secretariat, Ampara for the year ended 31 December 2022 in terms of Section 11 (1) of the National Audit Act No. 19 of 2018.

The above mentioned report is sent herewith.

M.P.I.M. Rashmi
Senior Assistant Auditor General
For Auditor General.

Copy to : The Director General, Department of State Accounts, General Treasury.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. EPCG/AM/A/Dis.Sec/02/SR/02/2023/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 26 දින.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 23 නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේදයට යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
1.6.1 (ඇ)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිටවූ, සේවය අත්හැරගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මාස 03 සිට වර්ෂ 03 ක කාල පරාසයක සිට හිඟහිටිව පැවැති රු.1,546,553 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2.6 (අ) (ii)
1.6.1.(ඊ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 16ක පදිංචිව සිටින පදිංචිකරුවන්ගෙන් රු.355,782 ක හිඟ කුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2.6 (අ) (i)
3.1.1	නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ග්‍රාමසේවා වසම් දෙකක සෞභාග්‍යා වැඩසටහන යටතේ රු.600,000 ක් වටිනා කුකුල් පැටව් 1800 ක් ප්‍රතිලාභීන් 60කට ලබාදී තිබුණත්, සියයට 24 ක් හෙවත් රු.282,000ක් වටිනා කුකුල් පැටව් 430 ක් මාස 03 ක් ඇතුළත මියයාම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට ලබාගත නොහැකි වී තිබුණි.	3.1.3(ආ)

3.2.(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 21කට අධික කාලයක සිට අළුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාරදී තිබුණත්, එය අළුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.	3.2. (අ)
3.2.(ඇ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2022 මැයි මාසය දක්වා යතුරු පැදි 43 ක් ධාවනයට යොදා නොගැනීම හේතුවෙන් වර්ෂ 03කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි.	3.2. (ආ)
3.2. (ඇ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, මහඔය, දමන, අඩ්ඩාලච්චේන සහ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	1.6.1 (v) 3.2 (ඉ)
3.3	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධානිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් කඩා සිදුවූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණත්, 2022 මැයි 19 දින වන විටත් ඉදිරි පියවර ගෙන නොතිබුණි.	3.3
3.4.(අ)	දීර්ඝකාලීන බදු පදනම්වින් ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කල්මුනේ සහ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකළ යුතු හිඟබදු එකතුව රු.2,863,604 ක් අයකර ගැනීමට පසුගිය වර්ෂ 03ක කාලයක සිට පියවර ගෙන නොතිබුණි.	3.5 (අ)

4	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව, උපරිම සේවා කාලය සෑම සේවා ස්ථානයකම වර්ෂ 05ක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ සැලැසීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු බව සඳහන් වූවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 51ක් වර්ෂ 06 සිට 31ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයක නියුතුව සිටියත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වෙනත් සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	6.1 (ඇ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(i) සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA82) ඇතුළත් මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂය අවසානට දක්වා ඇති ශේෂය රු.3,423,420,683 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ශේෂය රු.3,418,509,244 ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ආරම්භක ශේෂය අතර රු.4,911,439 ක වෙනස්කමක් පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශ වාර්තාවෙහි (SA80) වත්කම් අයිතම දෙකකට අදාළ ශේෂය රු.1,884,053,167 ක් වුවද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) තුළ එම වත්කම් අයිතම දෙකකට අදාළ ශේෂය රු.1,879,141,727 කි. ඒ අනුව, මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් වාර්තා දෙකකින් අගයන් දෙකක් ලෙස අනාවරණය කර තිබුණි.

(iii) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.27,942,223 ක් වුවද භාණ්ඩාගාර සටහන් අනුව (සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව - SA82) අනුව එය රු.26,208,493 ක් වූයෙන් රු.1,733,730 ක වෙනසක් පැවතුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ සහ කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම්, ගොඩනැඟිලි සහ ඉන්වෙන්ටරි ද්‍රව්‍ය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(v) දමන, අඩ්ඩාලච්චානේ, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(vi) 2017 හා 2018 වර්ෂයන්හිදී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ඇතැම් ලේඛන විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

	ලේඛනය වර්ගය	අදාල රෙගුලාසිය	නිරීක්ෂණය
(i)	හානි හා පාඩු පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.
(ii)	විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 454(2)	යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.
(iii)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891(1)	යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක ඉටුකිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 658 ක් සඳහා වර්ෂය තුළ සැලසුම් කළ පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරීම නිසා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු රු.112,295,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වියදම් අයිතම පහක් යටතේ සම්පාදනය කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 10 සිට සියයට 35 දක්වා වූ ප්‍රතිපාදන අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන ඉතිරි කර තිබුණි. ඒ අනුව නිවැරදිව ඉදිරි වියදම් පුරෝකථනය කරමින් අයවැය ලේඛනය සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද පසුගිය වසර 04 සලකා බැලීමේ දී වැය විෂය අංක 270-1-0-2401 යටතේ සියයට 30 කට වඩා වැඩි මුදලක් ඉතිරි කර ගෙන ඇති අතර සමාලෝචන වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී එය සැලකිල්ලට නොගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ආ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 දෙසැම්බර් 13 දිනැති හා අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව එක් එක් වැය විෂය සංකේතය යටතේ මුලු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 හෝ රු.10,000/- යන දෙකෙන් කවර හෝ අගයකට වඩා වැඩි වන්නේ නම් එම වෙනස සාධාරණීකරණය කිරීමට අවශ්‍ය කරුණු ඒසීඒ - 2(ii) ආකෘතියෙහි ඇතුළත් විය යුතු වුවද 270-1-1-0-1404 වැය විෂය යටතේ ඉතිරි වී තිබූ රු.515,786 ක ප්‍රතිපාදන සඳහා සාධාරණීකරණය කිරීමට අවශ්‍ය කරුණු ඇතුළත් වී නොතිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

අම්පාර නගර සභාව විසින් නිකුත් කර ඇති 2023 පෙබරවාරි 02 දිනැති හා අංක AM/UC/ACC/1/1/46 දරන ලිපිය අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.739,209 ක වරිපනම් බදු අම්පාර නගර සභාව වෙත ගෙවිය යුතුව තිබුණි. එසේ වුවද අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම වටිනාකම් බැරකම් හා බැඳීම් ප්‍රකාශය තුළ පෙන්නුම්කර නොතිබුණි. තවද එම වටිනාකම් ගෙවීම් කළ බවට සාක්ෂි නොමැති අතර මෙම බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ඉතිරියක් අදාළ වැය ශීර්ෂය යටතේ නොමැති බව නිරීක්ෂණය විය.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශය

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද පරිසර හිතකාමී පොහොර ප්‍රතිපත්තිය යටතේ 2022/ 23 මහ කන්නය වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් වෙත කාබනික පොහොර ලබාදීම වෙනුවෙන් රු.1,485,711,118 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම්තුමාගේ සභාපතිත්වයෙන් සමන්විත පොහොර අනු කමිටුවේ තීරණය අනුව අම්පාර දිස්ත්‍රික් ජාතික පොහොර ලේකම් කාර්යාලය හා ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය ඒකාබද්ධව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.893,415,900 ක වියදමක් දරමින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 29 ක ගොවීන් වෙත බෙදාදීම වෙනුවෙන් කාබනික පොහොර මිලදීගෙන තිබුණි. විගණන නියැදි පරීක්ෂණය අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගොවීන් වෙත නිකුත් නොකරන ලද රු.8,577,405 ක වටිනාකමින් යුතු කාබනික පොහොර තොග ගොවිජන සේවා මධ්‍යස්ථාන තුනක ගබඩාවන්හි හා ගොවිජන සේවා මධ්‍යස්ථාන තුනකට අයත් ගොවි සංවිධාන ගබඩාවන්හි ගබඩාකර තිබුණි. ගොවීන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවන්හිදී ඔවුන් විසින් සිදුකරන ලද ප්‍රකාශ අනුව ගොවීන් විසින් මෙම පොහොර භාවිතයට අකමැති වීමත්, නිවැරදි කාල සීමාව තුළ පොහොර නොලැබීමත්, ලබාදුන් පොහොර නියමිත ප්‍රමිතියෙන් තොර වීමත් යනාදි කරුනු මෙලෙස පොහොර ඉතිරිවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ii) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පරිසර හිතකාමී පොහොර බෙදාහැරීම 2022/ 23 මහ කන්නය - මාර්ගෝපදේශයේ 3.8 වගන්තිය අනුව 2022 යල කන්නයේ ඉතිරි වී ඇති කාබනික පොහොර කෘෂිකර්ම අමාත්‍යාංශයේ විශේෂ අනුමැතිය යටතේ 2022/ 23 මහ කන්නය වෙනුවෙන් ගොවීන් වෙත ලබාදිය හැකි වුවද ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක් තුළ එලෙස 2022 යල කන්නයේ දී ඉතිරි වී ඇති රු.68,686,000 ක් වටිනා කාබනික පොහොර තොගය 2022/ 23 මහ කන්නයේ බෙදා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022/ 23 මහ කන්නයේ දී කාබනික පොහොර මිලදී ගැනීමේ දී රාජ්‍ය වියදමින් රු.68,686,000 ක් ඉතිරිකර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) **කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක් තුළ 2010 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද ණය ව්‍යාපෘති 05 කට අදාළව රු.1,208,212 ක් අය කර ගත යුතුව පැවතුණි.

(ඇ) **ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලැබීම්**

(i) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා තොරාගත් ප්‍රතිලාභීන් අදියර දෙකක් යටතේ එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය රු.6,197,323 ක වියදමින් ක්‍රියාත්මක කර තිබුණි. විගණන නියැදි පරීක්ෂණය අනුව එලෙස ලබා දුන් එළුවන් අතරින් පළමු අදියර යටතේ රු.194,000 ක් වටිනා එළුවන් 09 දෙනෙකු ද දෙවන අදියර යටතේ රු.215,115 ක් වටිනා එළුවන් 09 දෙනෙකු ද වශයෙන් රු.409,115 ක වටිනාකමකින් යුතු එළුවන් මිය ගොස් තිබුණි. මිය ගොස් තිබුණු එළුවන් නියමිත බරින් යුක්ත නොවීමත්, අදාළ චක්‍රලේඛය අනුව ප්‍රතිලාභීන් වෙත එළුවන් ඇති කිරීම සඳහා වූ පුහුණුවක් ලබා නොදීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අදාළ ආයතන මට්ටමින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව අධීක්ෂණය දුර්වල වීමත් මේ සඳහා හේතු වී ඇති බවත් නිරීක්ෂණය වූ අතර ප්‍රතිලාභීන් හට ලබා දී තිබුණු එළුවන් සඳහා රක්ෂණාවරණ ලබාගෙන නොමැති වීමද හේතුවෙන් එම මියගිය එළුවන් වෙනුවෙන් අදාල ප්‍රතිලාභීන් හට වෙනත් විකල්ප ප්‍රතිලාභයක් හෝ නොලැබී ඇති බැවින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ii) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ආර්ථික බෝග වගා වැඩසටහනේ උඳු/ මුං බෝග වගා ව්‍යාපෘතියට (BG - Black Gram/GG - Green Gram - 2022) අදාලව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් තුළ ප්‍රතිලාභීන් 1073 දෙනෙකු වෙත රු.6,195,575 ක වටිනාකමින් යුතු මුං ඇට බීජ කි.ග්‍රෑ. 5926.5 ක් බෙදා දී තිබුණි. විගණන නියැදි පරීක්ෂණය අනුව මෙම මුං බීජ 2022 වර්ෂයේ ජූලි හා අගෝස්තු මාසයන්ගෙන්

ආරම්භ වන තුන්වන කාර්තුව සඳහා වගා කිරීමට අපේක්ෂා කළ ද අදාල බීජ ගොවීන් වෙත ලබා දී තිබුණේ 2022 දෙසැම්බර් මස වන බැවින් මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත කාලය තුළ ගොවීන් වෙත ප්‍රතිලාභ ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

(i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂය සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන් ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.1,840,680 ක් වියදම් කර තිබුණි. ඒ අනුව නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2022 නොවැම්බර් 16 දින සහ 2023 ජනවාරි 31 යන දිනයන්හි දී කුකුල් පැටවුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. කෙසේ නමුත් කුකුල් පැටවුන් ලබා දී මාස 03 ක කාලයක් තුළ රු.822,420 ක වටිනාකමින් යුතු කුකුල් පැටවුන් 942 ක ප්‍රමාණයක් මියගොස් තිබුණි. එම මියගිය කුකුල් පැටවුන් වෙනුවෙන් විගණන දිනය වන විටත් වෙනත් කුකුල් පැටවුන් ලබාදීමක් සිදු නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් කරන ලද රු.822,420 ක ප්‍රතිලාභ අදාළ සමෘද්ධි ප්‍රතිලාභීන් හට නොලැබී ඇති බව නිරීක්ෂණය විය.

2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
(i) XIX පරිච්ඡේදයේ 5 සහ 5:1 වගන්ති	437,475	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 06 ක පදිංචිව සිටින පදිංචිකරුවන්ගෙන් හිඟ කුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.
(ii) XXIV පරිච්ඡේදයේ 4 වගන්ති	1,687,952	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිටවූ, සේවය අත්හැරගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මාස 03 සිට වර්ෂ 03ක කාල පරාසයක සිට හිඟ ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ --- මුදල් රෙගුලාසි 138	₹8,891	පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වවුචර් පත් අංක 2 කට අදාළව ගෙවීම් කර තිබුණ ද එම ගනුදෙනු සහතික කර නොතිබුණි.
(ඇ)	මුදල් අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 15 දිනැති හා අංක MF/NPD 02/2021 දරන චක්‍රලේඛයේ 5.1 වගන්තිය	142,872	ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් මුළු ව්‍යාපෘති වටිනාකමින් සත්‍ය වශයෙන් වියදම් කළ මුදලින් 2% ප්‍රතිශතයක් පරිපාලන වැය ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාගත හැකිය වුවද ගම සමඟ පිළිසඳර වැඩසටහනට අදාළව මහඔය හා පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සීමාව ඉක්මවා පරිපාලන වියදම් ගෙවා තිබුණි.
(ඇ)	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක 01/2023 චක්‍රලේඛය		දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියලුම ගොඩනැගිලි පිළිබඳ 2022 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු 2023 මාර්තු 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

(ඉ)	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක 02/2023 චක්‍රලේඛය		දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියලුම ඉඩම් පිළිබඳ 2022 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු 2023 මාර්තු 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.
(ඊ)	රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 2009/09 චක්‍රලේඛයේ 2.iv වගන්තිය	5,191,174	වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද මහඔය, අම්පාර හා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2022 වර්ෂය සඳහා එලෙස ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමකින් තොරව නිලධාරීන් 141 දෙනෙකු වෙත අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි.

2.7 තැන්පතු

තැන්පත් කර වසර 02 ක් ඉක්මවා ඇති රු.11,944,076 ක වටිනා තැන්පතු වර්ග 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමට සෘජුව තැන්පත් කරන ලද රු.256,855 ක වටිනාකම හඳුනා නොගත් තැන්පතු ලෙස වර්ෂයකට වඩා වැඩි කාල සීමාවක් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වමින් තිබුණ ද ඒවා හඳුනා ගනිමින් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම සමඟ පිළිසඳර වැඩසටහන - 2022 යටතේ හෙළකෝමාන කොරමදයාලන්ද මාර්ගය, සුමනසාර විදුහල් මාර්ගය හා පළතුරුවැල්ල කපුදෙනියගල මාර්ගය යන මාර්ග 3ක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් එකතුව රු.1,747,571 ක වියදමක් දරා තිබුණි. එම මාර්ග 3 කොන්ක්‍රීට් කිරීම අදාලව ඇස්තමේන්තුවන්හි අයිතම අංක 07 අනුව අදාල මාර්ග මතුපිට නාර යෙදිය යුතු වුවද කොන්ත්‍රාත්තුව ලබාගත් ප්‍රජා මණ්ඩල විසින් අදාල කාර්යය ඉටු නොකිරීම මත ඒ සඳහා වෙන් කරන ලද රු.65,520 ක මුදල තැන්පතු ගිණුම තුළ රඳවා තිබුණද 2023 මාර්තු 31 දින වන විටත් අදාල කාර්යය ඉටුකරවා ගෙන නොතිබුණි.

(ආ) පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ගම්මාන වැඩසටහන යටතේ වන ව්‍යාපෘති 05 කට අදාලව රු.184,293 ක වටිනාකමකින් යුතු කාර්යයන් ඉටුකර නොමැති වීම හේතුවෙන් එම වටිනාකම තැන්පතු ගිණුම තුළ රඳවා තබා තිබුණ ද 2023 මාර්තු 31 වන දින වන විටත් අදාල කාර්යයන් ඉටුකර ගනිමින් එම ව්‍යාපෘති සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම සමඟ පිළිසඳර වැඩසටහන - 2022 යටතේ රු.3,418,820 ක වටිනාකමකින් යුතු එළුවන් 300 ක් ප්‍රතිලාභීන් වෙත බෙදා දී තිබුණි. කෙසේ වෙතත් එම එළුවන්ගෙන් රු.1,142,295 ක් වටිනා එළුවන් 33 ක් මියගොස් තිබුණි. එම මියගිය එළුවන් වෙනුවෙන් නැවත ප්‍රතිලාභීන් වෙත වෙනත් කිසිදු ප්‍රතිලාභයක් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ දී ග්‍රාමසේවා වසම් දෙකක සෞභාග්‍යා වැඩසටහන යටතේ රු.600,000 ක් වටිනා කුකුල් පැටව් 1800 ක් ප්‍රතිලාභීන් 60කට ලබාදී තිබුණත්, සියයට 24 ක් හෙවත් රු.282,000ක් වටිනා කුකුල් පැටව් 430 ක් මාස 03 ක් ඇතුළත මියයාම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට ලබාගත නොහැකි වී තිබුණි.

3.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

(අ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2016 (RIDP) යටතේ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මොරදෙණිය ග්‍රාම නිලධාරී වසමේ ජල ව්‍යාපෘතිය සඳහා නළ ලිඳක් ඉදිකිරීමට රු.1,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉටුකර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2016 වර්ෂයේ දී රු.944,233 මුදලක් ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2021 ඔක්තෝබර් මස 31 වන දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ලබාගන්නා ලද මුදලින් ඔවුන් විසින් දරන ලද වියදම් අයකර ගනිමින් රු.510,250 ක මුදලක් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවීම් කර තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම මුදල තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලැබී වසර 07 ක කාල සීමාවක් තිබුණු අතර ව්‍යාපෘතිය අත්හැර දමා ඇති බවත් මෙම කාර්යය වෙනුවෙන් වැයකරන ලද රු.433,983 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවත් නිරීක්ෂණය විය.

(ආ) නැගෙනහිර පළාත් කෘෂිකර්ම, වාරි මාර්ග, සත්ව නිෂ්පාදන හා ධීවර, සමූපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද තිරසාර සාම්ප්‍රදායික කාබනික සංවර්ධන වැඩ සටහන යටතේ දමන හා උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි මහා පරිමාණ කාබනික පොහොර නිෂ්පාදනය වෙනුවෙන් 2021 වර්ෂය තුළ ප්‍රතිලාභීන් තිදෙනෙකු සඳහා රු.1,500,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණ ද 2023 මාර්තු 31 වන විටත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන මුදල තැන්පතු ගිණුමට ඇතුළත් කර තිබුණි.

3.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 15 වන දිනැති හා අංක MF/NPD 02/2021 දරන ගම සමඟ පිළිසඳරක් - 2022 වක්‍රලේඛයේ 3.3 වගන්තිය අනුව සියලුම ව්‍යාපෘති යෝජනා වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ යුතු වුවද පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ව්‍යාපෘති 42 කට අදාළ ප්‍රතිලාභීන් 190 දෙනෙකු වෙත බෙදා දිය යුතු රු.6,558,253 ක වටිනාකමකින් යුතු භාණ්ඩ බෙදා නොහැර 2023 අප්‍රේල් 04 දින වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගබඩා කර තිබුණු අතර දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක කරන ලද රු. 270,000 ක් වටිනා ව්‍යාපෘති දෙකක් අවසන් කර නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ 2017 වර්ෂය තුළදී SACOSAN සනීපාරක්ෂක වැඩසටහනේ තෙවන වර මුදල් ගෙවීම සඳහා ලබා දුන් රු.140,000 ක මුදලක් ප්‍රතිලාභීන් විසින් අදාල කාර්යය නිම නොකිරීම හේතුවෙන් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. කෙසේ නමුත් විගණන දිනය වන 2023 අප්‍රේල් 04 වන දින වන විටත් එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 21කට අධික කාලයක සිට අලුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාරදී තිබුණත්, එය අලුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2023 මැයි මාසය දක්වා යතුරු පැදි 28 ක් ධාවනයට යොදා නොගැනීම හේතුවෙන් වර්ෂ 03කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි.

(ඇ) සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අංක 43-3136 දරන වතුර බවුසරය 2013 වර්ෂයේ සිට වසර 10 ක පමණ කාල සීමාවක් භාවිතයට ගැනීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ ගාල්කර ඇති අතර 2023 පෙබරවාරි 17 දින වන විටත් එම වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොමැති නම් අපහරණය කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පැවති රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් ස්වේච්ඡා සංවිධානයක් වෙත ලබා දී තිබූ සංයුක්ත කොළ මඩින යන්ත්‍ර දෙකක්, ට්‍රැක්ටරයක් හා ට්ලරයක් එම ස්වේච්ඡා සංවිධානයේ ආරවුලක් හේතුවෙන් 2012 වර්ෂයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතලබා දී තිබුණ ද 2023 පෙබරවාරි 17 දින වන විටත් ඒ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණු අතර අදාල වාහන මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව සහ මහඔය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ඉඩම් 2022 දෙසැම්බර් 31 දින දක්වා අයිතිය පවරාගෙන නොතිබූ අතර එහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

3.3 පාඩු හා හානි

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් කඩා සිදු වූ පාඩුව රු.850,738 ක් ලෙස තක්සේරු කර තිබුණත්, 2023 මැයි 09 දින වන විටත් ඉදිරි පියවර ගෙන නොතිබුණි.

3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

අප ශාඛාව විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 30 දිනැති හා අංක AMP/A/Dist.Sec/2022/04 දරන විගණන විමසුම සඳහා 2023 මැයි 09 දින දක්වා ලේකම් කාර්යාලය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) දීර්ඝකාලීන බදු පදනම්න් ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කල්මුණේ සහ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකළ යුතු හිඟ බදු එකතුව රු.2,863,604 ක් අයකර ගැනීමට පසුගිය වර්ෂ 04 ක කාලයක සිට පියවර ගෙන නොතිබුණි.

(ආ) මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති සංචිත වාහනයක් වන අංක EPPA 7025 දරන කැබ් රථය 2020 අගෝස්තු මස 14 වන දින අනතුරට පත්වී තිබුණි. අනතුර හේතුවෙන් රථය අලුත්වැඩියා කිරීමට දරන ලද ඵියදම රු.1,286,062 ක් වන අතර රක්ෂණ ආයතනය විසින් ගෙවන ලද මුදල රු.552,543 කි. මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව ඉදිරිපත් කර ඇති අවසන් වාර්තාව අනුව රක්ෂණ ආයතනය විසින් ආවරණය නොවන අලාභය වාහනයේ රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණ ද වාහනය

අලුත්වැඩියාව වෙනුවෙන් දරන ලද රක්ෂණ ආයතනය මඟින් අයකර ගත නොහැකි වූ මුදල වන රු.773,517 ක් අම්පාර දිසත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර 2023 මාර්තු 25 දින අදාළ වාහනය ගරාජයෙන් නැවත ලබාගෙන තිබුණ ද 2023 මැයි 01 දින විටත් රජයේ මුදලින් දරන ලද අලාභය අදාළ රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟාකර ගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී ද නිසි අවධානය යොමුකර නොතිබුණි. වර්ෂය තුළ ලද ප්‍රතිපාදන මත පදනම්ව තිරසාර සංවර්ධන අරමුණු 08 ක් හඳුනාගෙන තිබුණු අතර තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 09 ක් කෙරෙහි කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2363 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2721 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 116 ක් පුරවා ගැනීමට හා 474 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ඉහත වක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 4/2017 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යාම්, සේවයෙන් පහකිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මියයාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්ය මණ්ඩල වෙනස්වීම් යාවත්කාලීන කර සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකල යුතු වුවද 2022 වර්ෂයේ 4 වන කාර්තුව සඳහා එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ ප්‍රකාරව, උපරිම සේවා කාලය සෑම සේවා ස්ථානයකම වර්ෂ 05ක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ සැලැසීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 27 දෙනෙක් වර්ෂ 06 සිට 12 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක නියුතුව සිටියත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වෙනත් සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

එම්.පී.අයි.එම්.රශ්මි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශකය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමවුම		
	100%-90%	75%-89%	50%-74%
යටිතල සංවර්ධනය සඳහා ලබා දීම්	-	-	21.60
ක්‍රියාත්මක කළ සමාජ සුභ සාධන කටයුතු	-	-	29.37
ජීවනෝපාය සංවර්ධනය සඳහා ලබා දීම්	-	-	14.62
පරිසර අංශයේ සංවර්ධනය සඳහා ලබා දීම්	-	-	13.98

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම.

5.1 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය

	ඉලක්ක / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණය පිළිබඳ දර්ශක	අද දක්වා ජයග්‍රහණවල ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
1	දරිද්‍රතාව තුරන් කිරීම	විවිධ මූලාශ්‍රවල සම්පත් සවිබලගැන්වීමට සහනික කිරීම.	i) ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 737 ක්‍රියාත්මක කරන ලදී.			
2	තිරසර කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කර සාගින්න දුරු කිරීම	වර්ෂ 2030 දී කෘෂි ඵලදායිතාවය දෙගුණ කිරීම හා ගොවීන්ගේ, ධීවරයින්ගේ හා කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ ආදායම ඉහළ නැංවීමට මැදිහත් වී දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.	i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක් ආවරණය වන පරිදි අක්කර 473.15 මුං වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.			
			ii) අක්කර 119.5 ක් ආවරණය වන පරිදි උඳු වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.			
			iii) වී ගොවීන් 25000ක් අතර එළවළු බීජ පැකට් 25000ක් නියර ගොවිතැන් සඳහා නිකුත් කර ඇත.			
			iv) ග්‍රාමීය මාර්ග, සුළු වාරිමාර්ග, ජල සම්පාදන, කෘෂි ළිං ආදී කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති 92 ක් නිම කර ඇත.			
			v) පරිත්‍යාග ලෙස ලැබුණු ඇන්කර් කිරි පැකට් 4212 ක් ප්‍රතිලාභීන් 2106 ක් අතර බෙදා දෙන ලදී.			
			vi) ලෝක ආහාර සංවිධානයෙන් ලැබුණු සහල් මෙට්‍රික් ටොන් 506.35 ක්, පරිප්පු මෙට්‍රික් ටොන් 202.54 ක් හා තෙල් මෙට්‍රික් ටොන් 45.57 ක් ප්‍රතිලාභීන් 10200 ක් අතර බෙදා දී ඇත.			
			vii) යුනිසෙක් සංවිධානයේ සහයෝගය මත ක්‍රියාත්මක උදෑසන ආහාර වේල වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් 2022 වර්ෂයේ සැප්තැම්බර් සිට ආහාර වේලක් ලබා දීම ක්‍රියාත්මක විය. මෙහි ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5031 වූ අතර වියදම රුපියල් මිලියන 32.93 ක් විය.			

3	සියළු වයස් කාණ්ඩයන්හි ජීවන යහපැවැත්ම තහවුරු කිරීම.	වසර 2030 වන විට නොමේරූ ළඳරු මරණ සංඛ්‍යාව හා බෝ නොවන රෝග මඟින් මියයන සංඛ්‍යාව 1/3 කින් අඩු කිරීම.	ව්‍යායාම් මං තීරු ඉදිකිරීම, ක්‍රීඩා පහසුකම් ලබා දීම ක්‍රීඩා පිටි ඉදිකිරීම හා නවීකරණය සම්බන්ධ ව්‍යාපෘති 4 ක් රෝගවලින් තොර ශක්තිමත් සෞඛ්‍ය තත්ත්වයන් ඇති කිරීම උදෙසා ක්‍රියාත්මක කරන ලදී.			
		රෝගවලින් වැළකීම, ප්‍රතිකාර හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින්				
		2030 දී සියළු දෙනා සඳහා සනීපාරක්ෂක හා ස්වස්ථක ළඟා කර ගැනීමේ සම අවස්ථා ඇති කිරීම.	පුද්ගලයින්ගේ සනීපාරක්ෂාව ඉහළ නැංවීම සඳහා මහජන වැසිකිළි නවීකරණ හා ඉදිකිරීම් ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක විය.			
4	යටිතල පහසුකම් ඇතුළත් තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදන පෝෂණය කිරීම.	ආර්ථික සංවර්ධනය උදෙසා ගුණාත්මක, කල්පවත්නා තිරසර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීම.	ග්‍රාමීය මාර්ගයන් සංවර්ධනය යටතේ කොන්ක්‍රීට් මාර්ග, ගුරුපාර, පාලම්, බෝක්කු හා අවශ්‍ය දෙපස කාණු පද්ධතීන් සංවර්ධනය කරන ලද අතර තිරසර කාර්මීකරණය අරමුණ විය.			
		කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙළඳපොළට ප්‍රවේශ වීම ඉහළ නැංවීම.	කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා යටිතල පහසුකම් හා වෙළඳපොළ පහසුකම් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.			

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය.

1. රටෙහි උද්ගත වූ ආර්ථික අවපාතය හා දේශපාලන නොසන්සුන්තාවය හේතුවෙන් බලාපොරොත්තු වූ මූල්‍යාධාර නොලැබීම් සිදුවූ අතර ඒ හේතුවෙන් සැලසුම් කල සංවර්ධන ව්‍යාපෘති හා දැනුවත් කිරීමේ වැඩසටහන් ළඟා කර ගැනීමට නොහැකි විය.

2. අත්‍යාවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍යයන්හි මිල අධික ලෙස ඉහළ යාම හා ඉදිකිරීම් ද්‍රව්‍ය වෙළඳපොළේ හිඟ වීම මත කොන්ත්‍රාත්කරුවන් පූර්වයෙන් එකඟ වූ මිල ගණන් යටතේ ඉදිකිරීම් කිරීමට එකඟ නොවීම හේතුවෙන් සනීපාරක්ෂක ව්‍යාපෘති මෙන්ම යටිතල පහසුකම් ව්‍යාපෘති ද ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

3. අත්‍යාවශ්‍ය ඖෂධ හා වෛද්‍ය උපකරණ සපයා ගැනීමට අපහසු විය.

4. ඉන්ධන හා ගෑස් හිඟය හේතුවෙන් කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා බාධා ඇති විය.

5. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය සමහර උපකරණ වෙළඳපොළේ නොමැති වීම හා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත සමහර ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති පළමු කාර්තුවේදී ක්‍රියාවට නැංවීමට නොහැකි විය.

6. රටතුළ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදායම් තත්ත්වය පහළ යාම මත ඔවුන්ගේ එදිනෙදා පෝෂ්‍යදායී අවශ්‍යතාවයන් පසුරා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුව තිබේ.

කෙසේ වෙතත් ඉහත සියළු බාධක, අභියෝග මධ්‍යයේ වුවත් බලාපොරොත්තු වූ ඉලක්ක පසුරා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි විය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැනිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

#	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්තය)	
			ඇබෑර්තු	අතිරික්තය
ජ්‍යෙෂ්ඨ	97	81	16	-
තෘතීයික	77	33	44	-
ද්විතියික	1933	2407	-	(474)
ප්‍රාථමික	256	200	56	-
එකතුව	**2363**	**2721**	**116**	**(474)**

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම

බහු කාර්ය සංවර්ධන සහායකයින් හා සේවා පුහුණු ලාභීන් මගින් ද්විතියික හා ප්‍රාථමික නිලධාරීන්ගේ කාර්යයන් සිදුකර ගැනීම මගින් ආයතනයේ කාර්ය සාධනය පවත්වා ගැනීම කටයුතු කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
				දේශීය	විදේශීය		
1.	ආතති කළමනාකරණය පිළබඳ එක් දින පුහුණු වැඩමුළුව සදහා ඇස්තමේන්තුව (සිංහල මාධ්‍ය)	100	2022.10.22	83350.00	00	දේශීයව	හොඳයි
2.	සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය (සිංහල නිලධාරින් සදහා)	40	2022.03.09 2022.03.11	49195.00	00	දේශීයව	හොඳයි
3.	සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය (දමිළ නිලධාරින් සදහා)	40	2022.03.23 2022.03.25	50520.00	00	දේශීයව	හොඳයි
4.	සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය (දමිළ නිලධාරින් සදහා)	40	2022.03.28 2022.03.30	53490.00	00	දේශීයව	හොඳයි
5.	සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය	30	2022.06.29	36140.00	00	දේශීයව	හොඳයි
6.	රියදුරන්ගේ කාර්ය භාර්ය පිළිබඳ එක් දින පුහුණුව(සිංහල මාධ්‍ය)	13	2022.06.22	25992.00	00	දේශීයව	ඉතා හොඳයි
7.	රියදුරන්ගේ කාර්ය භාර්ය පිළිබඳ එක් දින පුහුණුව(දමිළ මාධ්‍ය)	17	2022.06.23	30952.00	00	දේශීයව	ඉතා හොඳයි
8.	නවක සංවර්ධන නිළධාරින් සදහා ධාරිතා සංවර්ධන තෙදින පුහුණු වැඩමුළුව (දමිළ මාධ්‍ය)	40	2022.02. 22	58100.00	00	දේශීයව	ඉතා හොඳයි
9.	නවක සංවර්ධන නිළධාරින් සදහා ධාරිතා සංවර්ධන තෙදින පුහුණු වැඩමුළුව (සිංහල මාධ්‍ය)	40	2022.03.15	58100.00	00	දේශීයව	ඉතා හොඳයි

07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඬිනඩි ලේඛන/ පුද්ගල පඬිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	යාවත්කාලීන නැත	යාවත්කාලීනව පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත.
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ		අඛණ්ඩව සකස් කර පවත්වාගෙන යාමට උපදෙස් දී ඇත
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අදාළ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට දිගුකාලයක් ගත වේ.	අපහරණ කටයුතු කඩිනමින් නිම කරන ලෙස උපදෙස් ලබා දී ඇත.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	පවත්නා මූල්‍ය තත්ත්වය මත පරීක්ෂාව සිදු කිරීමට අපහසු වී ඇත.	අදාළ පරීක්ෂාව කඩිනමින් නිම කිරීමට උපදෙස් දී ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		ණය ශේෂ නිරවුල් කිරීම සඳහා කඩිනම් පියවර ගෙන ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ		කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කිරීමට උපදෙස් දී ඇත.

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරීදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		සකස් කරමින් පවතී.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		ඉදිරියේදී කටයුතු කරමි.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය.